ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## මාධ්‍ය නිවේදනය

**ශ්‍රී ලංකාවේ කිරි ගොවීන් සඳහා ඉන්දියාවේ ධාරිතා සංවර්ධන වැඩසටහනක්**

ශ්‍රී ලංකාවේ කිරි ගොවීන් 20 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් විශේෂ පුහුණු සහ ධාරිතා සංවර්ධන වැඩසටහනකට සහභාගී වීම සඳහා 2026 අගෝස්තු 16-23 දක්වා ඉන්දීය සංචාරයක නිරත වූහ. ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ 2025 අප්‍රේල් ශ්‍රී ලංකා සංචාරය අතරතුර ඉන්දියාව විසින් වාර්ෂිකව ශ්‍රී ලාංකික වෘත්තිකයන් 750 දෙනෙකු සඳහා විශේෂයෙන් සකසන ලද පුහුණු අවස්ථා පිරිනමන බවට කළ නිවේදනය අනුව මෙම පුහුණු වැඩසටහන සංවිධානය කර තිබිණ.

2. ඉන්දීය රජය විසින් සංවිධානය කරන ලද මෙම සතියක වැඩසටහන ගුජරාටයේ, ආනන්ද් හි ජාතික කිරි සංවර්ධන මණ්ඩලයේ දී පැවැත්විණ. කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ සමස්ත අගය දාමයම ආවරණය කරමින් තාක්ෂණික සහ තේමාත්මක සැසි රැසක් මෙම වැඩසටහනට යටතේ පැවැත්විණ. ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු කිරීම, කර්මාන්තය සම්බන්ධයෙන් දැනුම ශක්තිමත් කිරීම සහ ඉහළ නිෂ්පාදන හැකියාවන් ගොඩනැගීම යනාදිය කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රධාන මොඩියුලයන්ට සත්ව අභිජනන ක්ෂේත්‍රයේ තාක්ෂණික වර්ධනයන්, කිරි නිෂ්පාදන අගය දාමයේ ගුණාත්මකභාවය සහතික කිරීම, විවිධ වර්ගයේ සතුන් සඳහා ආහාර පාන ලබා දෙන ක්‍රම සහ සමබර පෝෂණයක වැදගත්කම යනාදිය ඇතුළත් විය.

3. අත්දැකීම් ඇසුරෙන් ඉගෙන ගැනීමට ද සහභාගිවූවන්ට අවස්ථාව සලසා දී තිබූ අතර ඒ අනුව ඔවුහු IDMC තොග කිරි ශීතකරණ ඒකකය, අමූල් TMR කර්මාන්ත ශාලාව, කයිරා කිරි සමූපකාරය සහ NDDB හි නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධන රසායනාගාරය ඇතුළු ප්‍රමුඛ පෙළේ ආයතන සහ කර්මාන්ත ශාලාවල නිරීක්ෂණ චාරිකාවන්හි ද නිරත වූහ. මෙම නියැළීම් තුළින් ශ්‍රී ලංකා කණ්ඩායමට නූතන කිරි නිෂ්පාදන ක්ෂේත්‍රය, නවීන නිෂ්පාදන තාක්ෂණයන් සහ වෙනස් වන සිල්ලර සහ සැපයුම් දාම භාවිතයන් පිළිබඳ වටිනා දැනුම් සම්භාරයක් ලබා ගැනීමේ අවස්ථාව හිමි විය.

4. තාක්ෂණික කුසලතා සංවර්ධනයට අමතරව, මෙම වැඩසටහන තුළින් ගොවීන්ගේ ජීවනෝපායන් වැඩි දියුණු කරන සහ තිරසාර කිරි නිෂ්පාදන පද්ධතීන් ගොඩනගන ඉන්දියාවේ සාර්ථක කිරි නිෂ්පාදන ආකෘතිය සම්බන්ධයෙන් වැදගත් කරුණු කාරණා

රැසක් දැන ගැනීමේ අවස්ථාව ද හිමි කර දෙන ලදී. මෙම වැඩසටහන තුළින් කාර්යක්ෂම කිරි ගොවිපළ පාලනය, පිරිසිදු කිරි නිෂ්පාදනය, සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදන භාවිතයන් සහ දේශගුණයට ඔරොත්තු දෙන සහ පාරිසරික වශයෙන් තිරසාර ප්‍රවේශයන් සම්බන්ධයෙන් සහභාගීවූවන්ගේ ධාරිතාවයන් ශක්තිමත් කරන ලදී.

5. මෙම විශේෂ පුහුණු වැඩසටහන ධාරිතා සංවර්ධනය සහ ජනතා කේන්ද්‍රීය ආර්ථික සහයෝගීතාවය සඳහා ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරමින් වෘත්තීය කුසලතා ශක්තිමත් කිරීම, දැනුම හුවමාරුව ප්‍රවර්ධනය කිරීම සහ දෙරට අතර ආයතනික සහ කර්මාන්ත සබඳතා ගැඹුරු කිරීම සඳහා අර්ථාන්විත දායකත්වයක් ලබා දුන්නේය.

***

**කොළඹ**
***2026* සැප්තැම්බර් *16***